

# දුම්බර පතලට ගියෙමු

**කුසුම්සිරි විජයවර්ධන**

පානදුර රත්නපුර මාර්ගයේ පිහිටි ඉංගිරිය නගරය පසුගිය සියවසේ මුල් භාගයේ නිතර කියැවෙන ප්‍රකට සන්ධිස්ථානයක් විය. එයට හේතුව එකල දුම්බර මිනිරන් පතල පිහිටියේ මේ ආසන්නයේ වීමයි. පතල් පොළේ විශාල පිරිසකට අවශ්‍ය අඩුවැඩිය ලබා දුන්නේ මෙම නගරය වන අතර ඔවුන් ගමරටවල් බලා ගියේ ද ඉංගිරියට පැමිණීමෙනි. එක් දහස් අටසිය ගණන්වල සිට 1930 දශකය අග භාගය දක්වා මෙම පතල රට පුරා ප්‍රකට වැඩ බිමක් විය.

ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් සපයා දුන් දුම්බර මිනිරන් රුසියාව, ජර්මනිය, එංගලන්තය වැනි රටවලට අලෙවි කෙරුණේ නැව් ගණනිනි. ඉංගිරියේ සිට කි.මී. 8ක් පමණ රත්නපුර දෙසට ගමන්කර ඇල්ලගාව පත්තිනි දේවාලය අසලින් දකුණට ඇති මාවත ඇදී යන්නේ කළු නදී නිම්නයේ දුම්බර පෙදෙසට ය. මෙම මාවතෙහි කි.මී.5 ක් පමණ ගමනකින් පසු පතල පිහිටි ඉසව්වට අප ළඟා වේ. මෙය අයත් වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන මැතිවරණ කොට්ඨාශයට ය. පැරණි බෙදීම් අනුව එය පිහිටා ඇත්තේ කුකුළු කෝරළේ ය. මෙහි දී හමු වන කළු ගඟ හරහා ඇල්ලගාව ඉදිකර ඇති ලෑලි පාලමෙන් අප රථය ගමන් ගත්තේ "ඩක... ඩක" යන ශබ්දය නඟමිනි. ඒ ලෑලි සෙලවීම නිසා හට ගන්නා හඬයි. පතල ක්‍රියාත්මක වන සමයේ මෙහි තිබී ඇත්තේ ඔරු සේවයකි.

එකල මිනිරන් ප්‍රවාහනය කර ඇත්තේ ද පාරු මඟිනි. කළු ගඟ ඔස්සේ බොල්ගොඩ ගඟට පිවිස කැපූ ඇලවල් ඔස්සේ ඒවා කොළඹට ප්‍රවාහනය කෙරුණි. එහෙත් පසුව වාහන ගමනාගමනය ප්‍රචලිත වීමත් සමඟ ඉතා වාසිදායක මේ ජල ප්‍රවාහන ක්‍රමය යටගියාවට එක් විය. ඒ අවදියේ භාවිත කළ පාරු කවි අදත් සමහරුන්ට මතක තිබේ.

කළු ගඟ ඉහළ ඇත්තේ පැණිගල ඇල්ල
ඉනුත් පහළ ඇත්තේ නාරගල ඇල්ල
වතුර අඩුදාට අමාරුයි නාරගල ඇල්ල
මේ ඇලිවල මල්ලි වේද කොටපොළ ඇල්ල

මෙසේ ඇලි වශයෙන් සඳහන් කරන්නේ දිය ඇලි නොවේ. ගං පත්ලේ ගල් නිසා සහ ගඟ පටුවීම නිසා වේගයෙන් ජලය ගලා බස්නා ස්ථානයන් ය. මෙ වැනි ස්ථානවල දී ඔරු පාරු පැදවිය යුතු වූයේ ඉතා ප්‍රවේශමෙනි.

බැසලා වල බඹ ගාණක් නැවැත්තුවා
කඩලා මිනිරන් අරගෙන ගොඩකෙරුවා
ඇදලා ඇල්ලගාවට පාරුවෙ පටවා
පැදලා ගඟේ ගෙන ගොස් කොළඹට බෑවා

අප රයිගම් කෝරලේ සිට කුකුළු කෝරළේට පිවිසියේ ඇල්ලගාව පාලම ඔස්සේ ගඟ තරණය කිරීමෙනි.

පාලමෙන් එගොඩ වූ අපට විඳගන්නට ලැබුණේ වඩාත් සෞම්‍ය දේශගුණයකි. අවට ඇති කඳු බෑවුම් රබර් වනයෙන් සහ වන වදුලින් යුක්ත ය. ජනගහනය එතරම් සිටින බවක් නොපෙනේ. නිවෙස් පිහිටා ඇත්තේ අතරින් පතර ය. අප සමඟ සිටි හොරණ චන්දන සමරවික්‍රම මිතුරා මඟ පෙන්වමින් තොරතුරු පැවසුවේ ය.

ශ්‍රීලාල් නිශාන්ත හෙට්ටිආරච්චි මිතුරා වටපිටාවේ ගැවසෙන පක්ෂීන් හඳුනා ගැනීමට උත්සාහ කළේ ය. මාර්ගය අසල නිවසක මෝටර් රථය නතර කළ අපි පා ගමනින් කුඩා බෑවුමක් පහළට බසින්නට වූයෙමු. දොළ පාරකින් එගොඩ වූ අප පිවිසුණේ පහළපොළ ඩබ්.ඩී. සරත් චන්ද්‍ර කුමාර ගේ නිවසට ය. පතල් භූමියේ දෝනා විවරය ඇතුළුව අක්කර දෙකක ඉඩමක් ඔහුට අයිති ය.

ඉතිරි ඉඩම් ප්‍රමාණය අයිති කිරිඇල්ල නැදුන් විහාරයට ය.

"තවත් විශාල මිනිරන් ප්‍රමාණයක් මේ පොළොව යට සැඟවිලා තිබෙනවා. මිනිරන් කැණීම හදිසියේ නැවැත්තුවේ නැත්නම් ඒවා ඒ දවස්වලම හාරනවා. ඒවා ප්‍රයෝජනයට ගන්න පුලුවන් නම් විශාල ආදායමක් රටට ලබාගන්න පුලුවන්. මමත් මේ ගැන කිහිප වරක්ම බලධාරීන්ට දැනුම් දුන්නා. ඒත් මේ සඳහා සාර්ථක වැඩපිළිවෙලක් නෑ. මිනිරන් පතල නැවත ආරම්භ කිරීම සඳහා ඔහු විවිධ සමාගම් වලට සහ නිලධාරීන්ට ලියූ ලිපි රාශියක් අද ඔහුගේ ෆයිල් කවරයක පුස්කමින් තිබේ.

දෙවන ලෝක යුද්ධය ආරම්භ වී මිනිරන් මිල පහළ යාමත් සමඟ 1940 වන විට මෙහි මිනිරන් නිෂ්පාදනය නතර වුණි. ඒ සමඟම පතල් පොළ කලම්බවාගෙන සිටි ගිරාන් බාස්, දොඩම්පෙ සේදිරිස් බාස්, මාකවිට ජේමිස් බණ්ඩා, වැනි චරිත කාලයේ වැලිතලයේ වැළලී ගියෝ ය.

එකල කඩපිල්, සේවක නිවෙස්, මිනිරන් ගබඩා ආදියෙන් සමන්විතව කඩිගුලක් සේ කාර්යබහුල වූ දුම්බර මැදපොළ සහ පහළ පොළ අද වනවදුලින් පිරි අඩු ජනගහනයක් වෙසෙන පාලු ගම්මානයකි.

මෙම මිනිරන් සැබවින් ම සෞභාග්‍යය උදා කළේ සේවකයන්ට නොව අයිතිකරුවන් ට ය. ඉතා දුෂ්කර පතල් ජීවිතයේ වෘත්තීය අයිතිවාසිකම් කිසිවක් සේවකයන්ට ලැබුණේ නැත. සුලු වැටුපකට වහල් මෙහෙයක් ලෙසින් ශ්‍රමය සූරාකනු ලැබුණි. මේ සෝ සුසුම කවියට නැගීමෙන් සිතේ බරින් මඳකට හෝ මිදීමට එකල ජනකවියා උත්සාහ ගත් බව අද අපට අසන්නට ලැබෙන පතල් කවිවලින් පෙනේ.

**කාලා ගියේ දම්බර මැද පොළේ දී**
**නාලා ගියේ ඇල්ලේ තොටුපලේ දී**
**යනවා දුටිම් ඉංගිරියේ පොළේ දී**
**යනවා මිසක් එවු තැන මේ කපේ දී**

ජනප්‍රවාදයට අනුව මේ අවට මිනිරන් ඇති බව මුලින් ම මිනිසුන් දැනගෙන ඇත්තේ අසල දුම්බර රබර් වතුයාගේ පිහිටි (කි.මී. 3 ක් පමණ දුරින්) අලිවල නම් ස්වභාවික ජල තටාකයේ ස්නානය කළ වල් අලින්ගේ සිරුරෙහි මිනිරන් තැවරී තිබෙනු දැකීමෙනි. ඊට පසු මිනිසුන් මේ අවට පතල් කැන මිනිරන් ගොඩගන්නට වූහ.

මෙහි සඳහන් "අලිවල" අද ඉතා සුන්දර නාන තොටක් වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇත. එය යටත් විජිත යුගයේ ඉංග්‍රීසි ජාතිකයන් පිහිනීම සහ ස්නානය කිරීම සඳහා භාවිත කළ ස්ථානයකි. දොළ පහරක ජලය එකතුවීමෙන් ගල්පර්වත වලින් සැදුණු අඩි 20 ක් පමණ ගැඹුරක් දක්වා ඇති සිහිල් නාන තටාකයක් එහිදී දැකගත හැකි ය.

දුම්බර දෝනාව මහා පරිමාණයෙන් අරඹා ඇත්තේ 1900 දී පමණ මැදපොල පතල් සමාගම විසිනි. එය ඉංග්‍රීසි සමාගමක් විය. ඊට පෙරත් මෙහි දේශීය ව්‍යාපාරිකයන් පතල් කැණ තිබෙන බව පැවසේ. පසුව මෙම සමාගම ලංකා පතල් සමාගම නමින් හැඳින්විනි. එහි ප්‍රධානියා වූයේ එස්.එස්. ෂෙඩ්වික් නම් සුද්දා ය. ඊට පසු මේජර් ඊ.බී.කර් මෙහි ප්‍රධානියා වී ඇත.

ඒ අවදියේ මෙම පතලේ වැඩ අධිකාරී වූයේ ආතර් ලූවී දවුන්ඩසේකර නම් අයෙකි. මහ කොස්ගහවල, පුංචි කොස්ගහවල, අල්ලිස පතලය, රඹුවන පතලය ආදී වශයෙන් පතල් කිහිපයක් ම මෙහි හාරා තිබුණි. එහෙත් ටික කලක දී මෙම පතල් තුළට ජලය විශාල වශයෙන් එක් රැස් වීම නිසා වැඩකටයුතු අක්‍රිය විය. මෙහිදී කර් නම් සුද්දා අපූරු උපායක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ඔහු පතල් සියල්ල සම්බන්ධ වන සේ කඳු බෑවුමේ සිට හරස් අතට සැතපුම් බාගයක් පමණ දිගට සිරස් දෝනාවක් කපා ඇත. මෙම දෝනා කට උසින් අඩි 17 ක් ද පළලින් අඩි 12 ක් ද වේ. එය සම්පූර්ණයෙන් ම ගමන් කරන්නේ කලුගල් සිදුරු කරමිනි. එහි කෙළවර ඇති පතලෙහි සිට ඉහළට සවිකර ඇත්තේ අඩි 100 ක් උස යකඩ හිණිමඟකි. ඊට පසු තවත් දෝනාවකි. කඳු පාමුල දෝනා විවරයෙහි සිට කඳු මුදුනට උස අඩි 330 කි.

*දොනාව ඉදිරි පස ඇති කොන්ක්‍රීට් කුලුණු දෙක එකල එය වසා දැමීමට භාවිත කළ ගේට්ටු කණු ය. දෝනා විවරය අසල ඇති පස් බෑවුම තරමක් බිඳී ගොසිනි. ඉහළින් ගලාහැලුනු ගල් කුට්ටියක් ඒ අසල දැකගත හැකි ය. එහෙත් විවරයේ සිට අඩි 15 ක් පමණ ඇතුළට ගිය විට හමුවන්නේ ශක්තිමත් කළුගල් පර්වතයයි. ඉදිරියට යන අපට දැනෙන සිසිල ක්‍රමයෙන් ඉහළ යයි. විවරයෙන් ගලා එන ආලෝකයේ අඩි 50 ක් පමණ දුරක් යන විට මිලාන වී යයි.*

මේ නිසා පතල්වල එක්වන ජලය මේ කලුගල් දෝනාව ඔස්සේ ගලා බැසීම ආරම්භ විය. අදටත් එම දෝනාව ඔස්සේ පිරිසිදු දිය පාරක් නොනවත්වා ගලා යයි. මෙම දොළ පහර, අසලින් ගලායන මාරලිය දොළට එකතු වේ. මෙය කළුගල් පතල යන නමින් ප්‍රසිද්ධ වූයේ ඉන් පසුව ය.

මේ අසලින් ගල් පර්වත පිරි නිම්නයක ගලා බසින මාරලිය දොළ ඉහළ කඳු බෑවුමේදී සුන්දර මාරලිය දිය ඇල්ල තනයි. අඩි 75 ක් පමණ උසකින් යුත් එම දියඇල්ල මලු දෙකක් වශයෙන් ගලා හැලෙන්නේ අපූරු දසුනක් මවා පාමිනි.

"කර් සුද්දගෙ කාලෙ මේ දෝනාවෙ වැඩ කෙරිල තියෙන්නේ විදුලි බලයෙන්. ඒ විදුලිය ලබාගෙන තියෙන්නේ මේ මාරලිය දොළ හරස් කරලයි. දැනටත් ඒ විදුලි බලාගාරෙ නටබුන් කණු දකින්න පුලුවන්." සරත් විස්තර කරයි.

අපි. මෙම දෝනාව වෙත ගමන් කළේ දොළ පහරෙහි බැස ජලය ඔස්සේ ය. සමහර තැනක දොළෙහි ගැඹුර අඩි 2 ක් පමණ විය.

දොනාව ඉදිරි පස ඇති කොන්ක්‍රීට් කුලුණු දෙක එකල එය වසා දැමීමට භාවිත කළ ගේට්ටු කණු ය. දෝනා විවරය අසල ඇති පස් බෑවුම තරමක් බිඳී ගොසිනි. ඉහළින් ගලාහැලුනු ගල් කුට්ටියක් ඒ අසල දැකගත හැකි ය. එහෙත් විවරයේ සිට අඩි 15 ක් පමණ ඇතුළට ගිය විට හමුවන්නේ ශක්ති-මත් කළුගල් පර්වතයයි. ඉදිරියට යන අපට දැනෙන සිසිල ක්‍රමයෙන් ඉහළ යයි. විවරයෙන් ගලා එන ආලෝකයේ අඩි 50 ක් පමණ දුරක් යන විට මිලාන වී යයි.

ඊට පසු අප අඳුරක අතරමං වෙයි. විදුලි පන්දම දල්වා බැලූ විට ගල් බිත්තිවල ඇති මිනිරන් කැබලි දිස්-නය දෙයි. අප කතා කරන හඬ දෝංකාර දෙමින් නැවත අපට ඇසෙන්නේ එදා මෙහි වැඩ කළ කම්-කරුවන් ගේ වියරු සිනහවක් ලෙසිනි.

වංගු ගැසෙමින් ඉදිරියට ඇදී යන දෝනාවේ හුස්ම ගැනීමට අපහසුවක් නැත්තේ සුළං කුහර වෙනම සකසා ඇති බැවිනි. ඒවා හඳුන්වන්නේ හුළං-වළ නමිනි. ඉදිරියට යාම භයානක කාර්යයක් වූ නිසා අප යළිත් ආපසු ඒමට පිටත් වුණි. එදා ධන උල්පතක් වූ මේ සම්පත යළිත් හාරා ගැනීමට මේ නවීන යුගයේ සැලසුමක් නොමැති වීම ගැන අප තුළ වූයේ කනගාටුවකි.

**රන් කහවනුයි වපුලේ පිටත මිහිතලේ**
**කළු ගඟ සෙමින් බැස යනවා නිසංසලේ**
**රන් සමනලුන් පොරකති දෙගොඩ ගංතලේ**
**දුම්බර සිරි නොදුටු ඇස් මොටද පින් කළේ**

දුම්බර පතල ගැන කියවෙන විටම ඒ අවට කාගෙත් මතකයට පිවිසෙන නමක් වන්නේ ගිරාන් බාස් ය. 1880 දී පතල් සමාගම ඇරඹීමට පෙර පතල් කරන සමයේ ඔහු මෙහි විශාලම මිනි-රන් මඩුවේ හිමිකරු විය. බෙන්තර යාලේගම වැසියකු වූ හෙතෙම කෲර පුද්ගලයකු මෙන් ම ගැහැණු සොඩකු විය. 1880 දී සිදු වූ ගිරාන් බාස් හටන මෙම කෲරත්වයට එරෙහිව කම්ක-රුවන් ගැසූ කැරැල්ලක් වැනි සිද්ධි-යකි. රැකියාව සොයා දුම්බරට පැමිණි ගිරෝනිස් අප්පුහාමි මෙහි පතල් අයිතිව සිටි ඇල්.ඩී. හරමානිස් අප්පුහාමි නම් ප්‍රභූවරයා ගේ පතලක රැකියාව කර පසුව එහි හිමිකරුවා බවට පත් විය. බොහෝ විට එකල පතල් කම්කරුවන්ට වැටුප් ලබාගැ-නීම ඉතා දුෂ්කර කාර්යයක් විය. වැටුප් ලබාගත් සමහරු මරා දමා එම මුදල් නැවත ආපසු ලබා ගැනීමට පතලේ හිමිකරුවන් ක්‍රියා කිරීම සිදු විය. දිනක් පාන්තියා නමින් ප්‍රකට වූ මතුගම අබේනිස්ට ද වැටුප් ලබා ගැනීමේ දී එය නොදී පසුදින කළු ගඟේ ඇල්ලගාවට පැමිණෙන ලෙස ගිරාන් බාස් පවසා ඇත. ඒ අනුව ඔහු උල්පිහියක් ද ගෙන ඇල්ලගාවට ගොස් ඇත. ඒ 1880 ඔක්තෝබර් 7 දා ය. අබේනිස් පැමිණි විට ගිරාන් බාස් "උඹට පඩි දෙන්න නැතැ" යි පවසා ඔහුට පහර දී පන්නා දැමීමට සූදානම් විය.

එහෙත් එවිටම ඉණේ ගසාගෙන සිටි පිහිය ඉවතට ගත් අබේනිස් ගිරාන් බාස්ට ක්ෂණිකව පිහියෙන් ඇන මරා දමන ලදී. එම ස්ථානයට පැමිණි ගිරාන් බාස්ගේ සොයුරා වූ ජුවානිස් ද ඔහු පිහියෙන් ඇන මරා දැම්මේ ය. පසුව පතල් කම්කරුවන් හා ගිරාන් බාස්ගේ අනුගාමිකයන් අතර දබරයක් ඇවිලී ගියේ ය.

එහිදී අප්පුහාමි නැමැත්තා අතින් අසා-ධාරණයට එරෙහි වූ අබේනිස් මරණ-යට පත් වී ඇත. මේ නිසා පතල් පොළේ කටයුතු දින කිහිපයකට නැවතුණු බව පැවසේ. මේ සිද්ධිය 1880 දී මුද්‍රණය කළ ගිරාන් බාස් හටන නම් කුඩා කවි පොත් පිංචේ අපූරුවට විස්තර වේ. අප දුම්බරින් සමුගත්තේ මෙවැනි අපූරු කතා පුවත් සිත තුළ රඳවාගෙන ය.

**විස්තර / සේයාරූ**
**කුසුම්සිරි විජයවර්ධන**

